# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

## නිෂ්පාදන සහ සේවා

STATISTICS DEPARTMENT
CENTRAL BANK OF SRI LANKA

## 2023 මාර්තු මාසයේදී, නිෂ්පාදන හා සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධන කලාපයට නැවත ලඟා විය


**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය මාස නවයක් අඛණ්ඩව පහත වැටීමෙන් පසු, 2023 මාර්තු මාසයේ දී 51.4ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන මාවතට අවතීර්ණ විය.** පෙර මාසයට සාපේක්ෂ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් උත්සව සමයේ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් නව ඇණවුම් සහ නිෂ්පාදන යන උප-දර්ශකයන්ගේ ඉහළ යෑම දායක විය. එසේ වුවද, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම්, සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශක කඩඉම් මට්ටමට වඩා පහළින් පැවතුනි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

**51.4**

**2023 මාර්තු**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම කෙරෙහි ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, එළඹෙන උත්සව සමය ඉලක්ක කරගනිමින් පසුගිය මාසවලට සාපේක්ෂව ඉහළ ඉල්ලුමක් පැවති බව බොහෝ ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. එසේ වුවද, විශ්‍රාම ගැනීම් සහ ඉල්ලා අස්වීම් නිසා ඇති වූ පුරප්පාඩු නොපිරවීම වැනි හේතු නිසා සේවා නියුක්තිය අඛණ්ඩව පහත වැටුණි. තවද, ඉදිරි කාලය තුළ අමුද්‍රව්‍ය මිල පහත වැටීමක් අපේක්ෂා කිරීම හේතුවෙන් සමහර සමාගම් නව මිලදී ගැනීම් ප්‍රමාද කරමින් තමන් සතු අමුද්‍රව්‍ය තොග භාවිතා කිරීමට පෙළඹුනු බැවින් මාර්තු මාසයේදී ද තොග මිලදී ගැනුම් අඩු විය. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මෙම මාසය තුල දී සුළු වශයෙන් අඩු විය.

| විචලයය | පෙබ. | පෙබ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **42.3** | **51.4** | **+** | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| <u>**උපදර්ශක**</u> | | | | |
| නව ඇණවුම් | 41.5 | 55.9 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 40.0 | 55.8 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 40.0 | 45.2 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 43.5 | 45.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 47.3 | - | කඩඉම් මට්ටමේ සිට පහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දැනට දක්නට ලැබෙන යහපත් ආර්ථික ප්‍රවණතා හේතුවෙන් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ යන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2023 පෙබරවාරි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3කින් පහළ යමින් 2023 මාර්තු මාසයේ දී 49.6ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පසුගිය මාසයට සාපේක්ෂව 2023 මාර්තු මාසයේ දී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉන්දියාව සහ සිංගප්පූරුව යන රටවල වැඩි වේගයකින් ද රුසියාවේ අඩු වේගයකින් ද වර්ධනය විය. එසේ වුවද, යුරෝපා කලාපය, එක්සත් රාජධානිය, සහ එක්සත් ජනපදය යන රටවල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව 2023 මාර්තු මාසයේ දී පහළ යන ලදී. තවද, චීනයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 මාර්තු මාසයේ දී කඩඉම් මට්ටමේ ම පැවතුනි.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 අප්‍රේල් 12 වන දිනට*

[1] *එස්&පී ග්ලෝබල් (S&P Global) ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 මාර්තු මාසයේ දී 55.1ක දර්ශක අගයක් වාර්තා කරමින් වර්ධන කලාපයට නැවත ළඟා විය.** මේ සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ වර්ධනය හේතු විය.

ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, රක්ෂණ සහ වෘත්තීය සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ, 2023 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2023 මාර්තු මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම්, පෙබරවාරි මාසයේ දක්නට ලැබුණු පහළ යෑමෙන් පසු, 2023 මාර්තු මාසයේ දී නැවතත් ඉහළ යන ලදී. ඒ අනුව, තැන්පතුවල දක්නට ලැබුණු ඉහළ යෑමත් සමඟ මූල්‍ය අංශය අඛණ්ඩව වර්ධනය වූ අතර, අනෙකුත් පෞද්ගලික සේවා උප අංශය ද සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මේ අතර, සෞඛ්‍ය, රක්ෂණ, අධ්‍යාපන සහ වෘත්තීය සේවා උප අංශ ද මාර්තු මාසය තුළ සුළු වැඩිවීමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, අලුත් අවුරුදු උත්සව සමයට පෙර තොග සහ සිල්ලර වෙළඳාමෙහි යම් වර්ධනයක් දක්නට ලැබුණද, එම උප අංශයට අදාළ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල අඛණ්ඩව පහළ යෑමක් පෙන්නුම් කළේය.

සෘතුමය ඉල්ලුම සපුරාලීම සඳහා සුළු වශයෙන් නව බඳවාගැනීම් සිදු වුවද, සේවයෙන් ඉවත්වීම්, රැකියා සඳහා විදේශගත වීම් සහ විශ්‍රාම ගැනීම් හේතුවෙන් මාර්තු මාසයේ දී සේවා නියුක්තිය අඛණ්ඩව නමුත් අඩු වේගයකින් පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන්ද අඩු වේගයකින් පහළ ගියේය.

| විචල්‍යය | 2023 පෙබ. | 2023 මාර්. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **48.7** | **55.1** | **+** | **පහළ යෑමක සිට ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 49.0 | 59.7 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 45.0 | 56.1 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.5 | 42.9 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 43.6 | 46.6 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 63.5 | 70.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන්, අලුත් අවුරුදු උත්සව සමය, ආර්ථික තත්ත්වයන් වර්ධනය වීම සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම අනුමත වීම මධ්‍යයේ මාර්තු මාසයේ දී වැඩි වේගයකින් වර්ධනය විය. කෙසේ වෙතත්, ඉහළ විදුලි ගාස්තු හේතුවෙන් මෙහෙයුම් පිරිවැය ඉහළ යෑම සහ ඉහළ දැමූ බදු අනුපාත පිළිබඳව සමහර ප්‍රතිචාර දක්වන්නන් තම අසතුට පළ කරන ලදී.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.1**

**2023 මාර්තු**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2023 පෙබරවාරි මාසයේ පැවති 52.6 සිට 2023 මාර්තු මාසයේ දී 54.4 දක්වා ඉහළ ගියේය.

චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අනුව එම රටවල සේවා අංශය පසුගිය මාසයට සාපේක්ෂව 2023 මාර්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2023 අප්‍රේල් 12 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.